කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. කොවිඩ්-19 වැළඳීම කිසිදු පුද්ගලයෙකුගේ වරදක් නොවේ. කොවිඩ්-19 වාර්තාකරණයේදී මාධ්‍ය මෙම නිර්දේශයන් හා අනුකූල වීම අත්‍යාවශ්‍ය යැයි පවසන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට ඇති හැකියාව අවම කිරීම සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීම සඳහායි.

කෙසේ වුවත් කණගාටුවට කරුණ වන්නේ, තවමත් ඇතැම් මාධ්‍ය මගින් ඉහත නිර්දේශය උල්ලංඝනය කිරීමයි. උදාහරණයක් ලෙසින් අරුණ පුවත්පතේ (01/25) පුවත් වාර්තාවක සිරස්තලය දැක්විය හැක. එහි සඳහන් වන්නේ "ආසාදිත සේවිකාව නිසා පාසලේ 17ක් නිරෝධායනයට" යනුවෙනි. එහිදී අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මෙම සේවිකාවට කොවිඩ්-19 ආසාදනය වීම සහ පාසලේ අනිකුත් 17ක් දෙනා නිරෝධායනයට ලක් වීම, එම සේවිකාවගේ වරදක් ලෙසින් නොදැක්වෙන්නේද? එසේ නම් එය ආචාර ධර්ම විරෝධී වාර්තාකරණයක් නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna